# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,423/6 – 2005 දෙසැම්බර් 13 වැනි අඟහරුවාදා – 2005.12.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78V.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 24අ වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2005 නොවැම්බර් මස 02 වැනි දින දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2005.10.01 දින සිට බලාත්මක වන්නේය.

2. මේ නියමාවලිය, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කරන ලදුව 2005 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 1417/12 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන), පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට අදාළ වන්නේ ය.

3. මේ ආයතනය (මෙහි මින් මතු " විශ්ව විද්‍යාලය " යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

4. පනතේ විධිවිධානවලට සහ (මෙහි මින්මතු "කොමිෂන් සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව, ආයතනයට පහත සඳහන් කටයුතු සඳහා බලය ඇත්තේය ; එනම් :

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ;

(ආ) ඉංග්‍රීසි භාෂා ක්ෂේත්‍රයේ පාඨමාලා පැවැත්වීම ;

(ඇ) ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, පුහුණු කිරීම, පර්යේෂණ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ උපදේශනය සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඈ) අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අත්කරගෙන සිටින තැනැත්තන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ ව්‍යවස්ථාවලින් නියමිත අනෙකුත් කොන්දේසි සපුරා, උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ විශ්ව විද්‍යාලයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුස්සන්ව සිටින තැනැත්තන්, විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඉ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව ආයතනයේ විවිධ අධ්‍යයන පාඨමාලා පිළිබඳව පිරිනැමිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා තීරණය කිරීම ;

(ඊ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමග, ආචාර්යවරයන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රීධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරව සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(උ) ආයතනයට ප්‍රවේශවීම අපේක්ෂා කරන තැනැත්තන් විසින් විශ්ව විද්‍යාලයේ දී සමත් විභාග සහ ගතකළ අධ්‍යයන කාලසීමාව හෝ හැදෑරූ අධ්‍යයන විෂයය, පිළිගන්නා ලෙස විශ්ව විද්‍යාලයේ සනාතන සභාවට නිර්දේශ කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී එම පිළිගැනීම නියමිත අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ඉවත් කර ගැනීම ;

(ඌ) විශ්ව විද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව අලුත් අධ්‍යයන මණ්ඩල පිහිටුවීමට තීරණය කිරීම; සහ

(එ) විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව, ආයතනයේ අරමුණු සඳහා අවශ්‍ය වන උපදේශක, පුහුණු කිරීමේ, පර්යේෂණ, සංවර්ධන හෝ උපදේශන කාර්ය සඳහා අවශ්‍ය පුස්තකාල, රසායනගාර හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ඒ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වියහැකි ආචාර්ය තනතුරු, පරිපාලන තනතුරු හා වෙනත් තනතුරු ඇති කිරීමට, විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම සහ එම තනතුරු අහෝසි කිරීම හෝ තාවකාලිකව අත්හිටුවීම සඳහා විධිවිධාන සැළසීමට ;

(ඔ) විශ්ව විද්‍යාලය විමසා අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ පිරිනැමීම ;

(ඕ) අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවලින් කොටසක් ආයතනයෙන් බාහිරව පැවැත්වීම සඳහා විධිවිධාන යෙදිය යුතු යැයි නියම කෙරෙන යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවලින් කොටසක් හෝ ආයතනයෙන් බාහිරව පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම ;

(ක) ගාස්තු ගෙවීම නියම කෙරෙන යම් රීතියකට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීම හා ලබා ගැනීම ; සහ

(ග) ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස ඉහත කී බලතල, කාර්ය හා කර්තව්‍යවලට ආනුෂංගික හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම සඳහා බලය ඇත්තේ ය.

5. ආයතනයට පහත සඳහන් නිළධරයන් සිටිය යුතු ය.

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) තනතුරක් වශයෙන් නියමාවලිය මගින්, ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ද ඒ තනතුර දරන්නා, මේ ජේදයේ කාර්ය සඳහා නිලධරයකු වන්නා වූ ද වෙනත් යම් තනතුරක් දරන්නකු.

6. (1) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඉන්පසුව සෑම අධ්‍යක්ෂවරයකුම, ආයතනයේ කළමනාකරණ මණ්ඩලය නිර්දේශ කරන තැනැත්තන් තිදෙනෙකුගේ මූල මණ්ඩලයකින්, (මෙහි මින්මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පත් කරනු ලැබිය යුතු ය.

එසේ වුවද කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වඩා අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(2) ආයතනයේ අධ්‍යක්ෂවරයා කලින් ධූරය අත්හැරියහොත් මිස, හෝ (3) වන අනුජේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලසීමාවක් ගතවීම හෝ හැටපස් විය සම්පූර්ණ වීම යන මෙයින් කලින් එළැඹෙන දිනය තෙක් ධූරය දරන්නේ ය.

(3) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ (මෙහි මින්මතු ""මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ රැස්වීමක දී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන දෝෂාපරෝපණ යෝජනාවක් මත, පාලක සභාව විසින් හේතු දක්වා අධ්‍යක්ෂවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතින්, අධයක්ෂවරයා හැර වෙනත් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(4) ධූරයෙන් ඉවත් කරන ලද හෝ ධූරයෙන් ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබීමට ඉහතින් ම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු කලින් දැරූ තනතුරින් විශ්‍රාම ගැනීමේ වයසට එළැඹී නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරළා පැමිණිය යුතු ය.

(5) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා අධ්‍යක්ෂවරයාට ඔහුගේ ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි වීමෙන් දින හතක් ඇතුළත, ඒ ධූරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යැයි උපකුලපතිවරයා අදහස් කරන වැඩපිළිවෙලක් යෙදිය යුතු අතර, එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් (මෙහි මින්මතු "ලේඛකාධිකාරිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා ඒ ධූරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතු ය.

(6) අධ්‍යක්ෂ ධූරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, අධ්‍යක්ෂ ධූරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යැයි උපකුලපතිවරයා අදහස් කරන වැඩ පිළිවෙලක් උපකුලපතිවරයා විසින් යෙදිය යුතු අතර, එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් ලේඛකාධිකාරිවරයා අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කළ යුතු ය.

7. (1) අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිළධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිළධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් ආයතනයේ මණ්ඩලයේ සාමාජිකයකු ද ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයකු ද වන්නේ ය. ආයතනයේ වෙනත් යම් බල මණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සිටීමට හා ඒ රැස්වීමේ දී කථා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇති නමුත් ඔහු ඒ වෙනත් බල මණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, ඒ යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම නොමැති විය යුතු ය.

(2) මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා නීත්‍යානුකූලව වරින් වර තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව, නියමාවලියේ, පනතේ හෝ වෙනත් යම් සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදාළ වන තාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. තවද, ඒ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර, ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා, ආයතනයේ ගණන් තැබීමේ නිළධරයා වන්නේ ය.

(5) විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ විධානය යටතේ ආයතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වග කිව යුතු ය. විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා නොමැතිනම්, විශ්ව විද්‍යාලයේ උචිත අතුරු ව්‍යවස්ථා සහ වෙනත් රීති අදාළ විය යුතු ය.

8. ආයතනය පහත සඳහන් අංශවලින් සමන්විත විය යුතු ය :

(i) මණ්ඩලය ;

(ii) අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල ;

(iii) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් පුද්ගල මණ්ඩල.

9. මණ්ඩලය, ආයතනයේ ශාස්ත්‍රීය හා විධායක මණ්ඩලය වන අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(1) නිලබලයෙන් පත්වන සාමාජිකයන් හය දෙනෙක්, එනම්,

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබිය හැකි වෙනත් යම් අමාත්‍යාංශයක ලේකම්වරයා ;

(ඇ) ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුවේ සභාපතිවරයා ;

(ඈ) විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඉ) විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි මහාචාර්යවරුන් ; සහ

(2) තවත් සාමාජිකයන් අටදෙනෙක්, එනම්,

(අ) විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් එහි සාමාජිකයන් අතරින් නම් කරන එක් නියෝජිතයෙක් ;

(ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ඉංග්‍රීසි පිළිබඳ මාහාචාර්යවරුන් පස්දෙනෙක් හෝ (අදාළ වන පරිදි) ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, සහ වාග් විද්‍යා යන විෂයයන් ඉගැන්වීම භාර අධ්‍යයන අංශ ප්‍රධානයන් ;

(ඇ) (මෙහි මින් මතු "සනාතන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාල සනාතන සභාව විසින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගන්නා එක් සාමාජිකයෙක් ;

(ඈ) අධ්‍යයන මණ්ඩල විසින් ඒවායේ සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගන්නා සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඉ) තාක්ෂණය, අධ්‍යාපනය හෝ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ඨ සේවයක් ඉටුකර ඇති තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඊ) ගුරු අධ්‍යාපනය නියෝජනය පිණිස, ජාතික අධ්‍යාපන ආයතනයේ එක් නාමිකයෙක්.

10. (1) කොමිෂන් සභාවේ ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපතිවරයා, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, සාමාජිකයන් විසින් වෙනත් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(2) කලින් ධුරය අත්හැරියහොත් මිස, යම් නම්කළ හෝ තෝරා පත්කර ගනු ලැබූ හෝ පත් කළ සාමාජිකයකු ඔහු එසේ නම් කරනු ලැබූ හෝ තෝරා පත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු නැවත නම් කරනු ලැබීමට, තෝරා පත්කර ගනු ලැබීමට හෝ නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

එසේ වුව ද යම් නම් කරනු ලැබූ හෝ තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, ඔහුගේ ධුර කාලය ඉකුත් වීමට ප්‍රථම ධුරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහු ද ධුරය කලින් අත්හැර ගියහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

එසේම තවදුරටත්, යම් නම් කරනු ලැබූ, තෝරා පත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයා, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබුවේ යම් තරාතිරමක් ප්‍රකාරව ද එය දරන තාක් කල් ඔහු මණ්ඩලයේ සාමාජික ධුරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ තෝරා පත්කර ගනු ලැබූ යම් සාමාජිකයකු විසින් අධ්‍යක්ෂවරයා අමතා යවන ලිඛිත ඉල්ලීමක් මගින් සාමාජික ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයේ නම් කරනු ලැබූ යම් සාමාජිකයකු විසින් පාලක සභාවේ සභාපතිවරයා අමතා යවන ලිපියක් මගින් සාමාජික ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් ඔහු පත් කරනු ලැබූ පුද්ගල මණ්ඩලයේ සභාපතිවරයා වෙත එනම්, අදාළ වන පරිදි කොමිෂන් සභාවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිපියක් යැවීමෙන් සාමාජික ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, අවසර නොලබා මණ්ඩලයේ යම් අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය අත්හැරිය, සේ සැළකිය යුතු අතර, (5) වන අනුඡේදයේ සඳහන් පත්කිරීමේ බලධරයා විසින්, 9 වන නියෝගයේ (2) (ඇ) ඡේදයේ විධිවිධාන සැළකිල්ලට ගනිමින්, ඉන් ඇතිවන පුරප්පාඩුව සඳහා යෝග්‍ය තැනැත්තකු පත් කළ යුතු ය.

(7) ආයතනයේ සේවා නියුක්තකයකු වන මණ්ඩලයේ සාමාජිකයකුට කිසි පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකමක් නොමැති නමුත් අනෙකුත් සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා තීරණය කරන පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය යුතු ය.

(8) මණ්ඩලයේ රැස්වීමක් සඳහා සණපූරණය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු වේ.

(9) අවශ්‍ය වන කවර අවස්ථාවක වුව ද මණ්ඩලය රැස්විය යුතු ය. එසේ වුව ද එක් වර්ෂයක් තුළ මණ්ඩලය අට වාරයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(10) මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් සභාපතිවරයා වෙත ලැබී සතියක් ඇතුළත හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය. ඒ විශේෂ රැස්වීමේ අරමුණ ඒ ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් විය යුතු ය.

11. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට පහත සඳහන් කාර්ය සඳහා බලය ඇත්තේ ය :

(අ) ආයතනයේ චංචල හෝ නිශ්චල දේපළ දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනය හා සම්බන්ධ කාරණා තීරණය කිරීම සහ විධිමත් කිරීම ;

(ඇ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සහ කළමනාකරණය සඳහා සහ වෙනත් යම් නිශ්චිත කාර්යයක් සඳහා ආයතනයට ලබාදෙන අරමුදල් පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඈ) ආයතනයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් සහ වෙනත් ප්‍රදාන වශයෙන් ලැබෙන චංචල හෝ නිශ්චල දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පිළිගැනීම සහ භාර ගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව, විගණනය කළ වාර්ෂික ගිණුම් සහ ශේෂ පත්‍රය සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම්, විශ්ව විද්‍යාලයට හා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(ඊ) ඊළඟ මුදල් වර්ෂය සඳහා ආයතනයේ ඇස්තමේන්තු පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම සහ අනුමත කිරීමෙන් පසු ඒ ඇස්තමේන්තු විශ්ව විද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම;

(උ) අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල විමසා විශ්ව විද්‍යාලය වෙත-

(i) පාඨමාලා සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිර්දේශ කිරීම ;

(ii) එවැනි සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස ශිෂ්‍යයන් අනුගමනය කළ යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණු පාඨමාලා ද සමත් විය යුතු විභාග සහ සපුරාලිය යුතු අනෙකුත් කොන්දේසි, නිර්දේශ කිරීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා හා රීති සෑදීමට බලය පැවරී ඇති කවර හෝ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා හා රීති සෑදීම සහ අවස්ථාවෝචිත පරිදි ඒ අතුරු ව්‍යවස්ථා හෝ රීති පාලක සභාව හෝ සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම.

එසේ වුව ද අවස්ථාවෝචිත පරිදි අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසුව හැර අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් සාදනු නොලැබිය යුතු ය ;

(එ) ආයතනයේ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි, පරිශ්‍ර, ලී බඩු උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයීම ;

(ඒ) විශ්ව විද්‍යාලය විමසා-

(i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ, ආචාර්ය සහ පරිපාලන තනතුරු ඇතුලු තනතුරු ඇති කිරීම සඳහා සහ ඒ තනතුරු අවලංගු කිරීම සහ අත්හිටුවීම සඳහා ;

(ii) ආයතනයට පත්කර ගැනීම සඳහා ආචාර්යවරුන්ට, නිලධරයන්ට සහ අනෙකුත් සේවා නියුක්තයන්ට තිබිය යුතු වන්නාවූ සුදුසුකම් ;

(iii) ආයතනයේ ආචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් ලෙස පත් කර ගැනීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් ; කොමිසමට නිර්දේශ කිරීම ;

(ඔ) ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ සේවය අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඕ) සුදුසුයැයි සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු සංඛ්‍යාවක් පත්කිරීම සහ ඒවායේ නිර්ණේය විෂයයන් නියම කිරීම, ඒ කමිටුවල වාර්තා සලකා බැලීම සහ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ;

(ක) නිශ්චිත පැවරුම් සඳහා යෝග්‍ය තැනැත්තන්ගේ සේවය ඉල්ලා සිටීම හෝ ආයතනයට අනුයුක්ත කිරීමට යෝග්‍ය විශ්ව විද්‍යාලයේ කවර හෝ පීඨයක සේවය කරන තැනැත්තන්ගේ සේවය ඉල්ලා සිටීම;

(ග) පාඨමාලා සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීමේ හා ඇතුළත් කිරීමේ උපමාන, අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල විමසා සහ විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ච) නොයොදවා ඇති යම් ආදායමක් ද ඇතුළුව, ආයතනයට අයත් යම් මුදලක්, භාර ආඥාපනතේ 20 වැනි වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නාවූ යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිළට ගැනීම සඳහා එවැනි මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක්, කොමිෂන් සභාව අනුමත කරන යම් බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීම ;

(ජ) මේ නියමාවලිය මගින් හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ ඒ බලතලවලට ආනුෂංගික වන, ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාවේ යෙදීම.

(2) යම් ශාස්ත්‍රීය කාරණයක් පිළිබඳ කිසිදු යෝජනා සම්මතයක්, ඒ පිළිබඳව ස්වකීය මතය වාර්තාගත කිරීමට සහ එම මතය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අධ්‍යයන මණ්ඩලයට හෝ අධ්‍යයන මණ්ඩලවලට ප්‍රථමයෙන් අවස්ථාවක් ලබාදීමෙන් පසුව මිස, මණ්ඩලය විසින් එවැනි යෝජනා සම්මතයක් සම්මත නොකළ යුතු ය.

එසේ වුව ද, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස එසේ අනුමත කරන යෝජනා සම්මතයක් පරිදි ක්‍රියා නොකළ යුතු ය.

මේ ඡේදයෙහි "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන් අධ්‍යයන මණ්ඩලයක හෝ මණ්ඩලවල පාලනයට සහ සාමාන්‍ය විධානයට යටත් කවර හෝ කාරණයක් අදහස් වේ.

12. (1) අධ්‍යයන මණ්ඩලයක් හෝ අධ්‍යයන මණ්ඩල තිබිය යුතු අතර ඒවා පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :

(අ) අධ්‍යක්ෂවරයා, ඔහු සභාපති විය යුතු ය ;

(ආ) ආයතනයෙහි පුස්තකාලය සහ වෙනත් මාධ්‍ය සම්පත් හෝ තොරතතුරු තාක්ෂණය හා සම්බන්ධ සම්පත් ඇතුළත් විය යුතු, ආයතනයේ ඉගෙනීමේ සම්පත් භාර තැනැත්තා ;

(ඇ) ආයතනයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, අධ්‍යයන මණ්ඩලයට හෝ ඒ ඒ අධ්‍යයන මණ්ඩලවලට අදාළ වන, ආයතනයේ ස්ථිර ආචාර්යවරුන් ;

(ඈ) ආයතනයේ ශිෂ්‍යයන් විසින් තෝරා පත්කර ගන්නා ශිෂ්‍යයන් දෙදෙනෙක් ;

(ඉ) ආයතනයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් දරන තැනැත්තන් අතරින්, මණ්ඩලය විසින් තෝරා පත්කර ගත යුතු, ආයතනයේ කාර්ය මණ්ඩලයේ නොවන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඊ) මණ්ඩලයේ විෂය සීමාවට යටත් විෂයයන් උගන්වන, ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුව විසින් තොරා ගන්නා, තැනැත්තන් දෙදෙනෙක් ; සහ

(උ) කොමිෂන් සභාවේ, ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරා ගන්නා, ඉහත සඳහන් කිසි ගණයකට අයත් නොවන ආචාර්යවරුන් දෙදෙනෙක්.

(2) අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා තැනැත්තන් එක්කෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් වැඩිපුර එක් කර ගත හැකි නමුත් එසේ වැඩිපුර එක්කර ගන්නා ලද තැනැත්තකුට අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල ඡන්ද විමසීමක දී ඉදිරිපත් වීමට හෝ යම් රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැත්තේ ය.

(3) අධ්‍යයන මණ්ඩලයේ හෝ අධ්‍යයන මණ්ඩලවල රැස්වීමක් සඳහා අවම සණපූරණය, වැඩිපුර එක්කර ගන්නා ලද සාමාජිකයන් ඇතොත් ඔවුන් අත්හැර, සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විය යුතු ය.

(4) අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල, අවශ්‍ය කවර හෝ අවස්ථාවක රැස්විය යුතු අතර, එක් එක් වර්ෂය තුළ හය වතාවකට නොඅඩු වාර ගණනක් වන සේ රැස්විය යුතුය.

(5) (1) වන ඡේදයේ ( ඈ) අනුඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයන් –

(අ) විභාග පිළිබඳ කාරණා හෝ විභාග සම්බන්ධ කාරණා සාකච්ඡා කෙරෙන අධ්‍යයන මණ්ඩලයක හෝ අධ්‍යයන මණ්ඩලවල යම් රැස්වීමකින් බැහැර කළ යුතු අතර, එම බැහැර කිරීම එසේ ම තිබුණ ද එම රැස්වීම යථා පරිදි පවත්වනු ලැබූ ලෙස සැළකිය යුතු ය. තව ද,

(ආ) ආයතනයේ පාඨමාලා සඳහා ඔවුන් ලියාපදිංචිව සිටින හා ඔවුන්ගේ ශිෂ්‍යභාවය පවත්නා කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(6) නියමිත කාලයට කලින් ධුරය අත්හැරියහොත් මිස, (I) වන ඡේදයේ (ඉ) අනුඡේදය යටතේ තෝරා පත්කර ගන්නා ලද එක් එක් සාමාජිකයා, ඔහු තෝරා පත්කර ගනු ලැබූ දින සිට ගණන් බලන ලද අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් පහ කරනු ලැබුවහොත් මිස නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සෙක් විය යුතු ය.

එසේ වුව ද තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයකු ඔහුගේ ධුර කාලය ඉකුත් වීමට ප්‍රථම ධුරය අත්හැරියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

එසේම තවදුරටත්, ධුර දැරීම සඳහා තෝරා පත්කර ගන්නා සාමාජිකයන් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු බවට පත් වූයේ යම් තරාතිරමක් දැරීම ප්‍රකාරව ද ඒ තරාතිරම දරන තාක් කල් පමණක් ඔහු එම ධුරය දැරිය යුතු ය.

(7) අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල කවර හෝ තෝරා පත්කර ගත් සාමාජිකයකු විසින් අධ්‍යක්ෂවරයා අමතා යවන ලිඛිත ඉල්ලීමක් මගින් ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) අධ්‍යයන මණ්ඩලයක් හෝ මණ්ඩල සඳහා සණපූරණය එහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් එකක සංඛ්‍යාවක් විය යුතු ය.

13. (1) පනතේ විධිවිධානවලට සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ ඉගැන්වීම,. පුහුණු කිරීම, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ සාමාන්‍ය විධානය අධ්‍යයන මණ්ඩලය හෝ මණ්ඩල සතු විය යුතු ය.

(2) (1) වන අනුඡේදයන් ශාස්ත්‍රීය කමිටුවට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ශාස්ත්‍රීය කමිටුව විසින් .–

(අ) මණ්ඩලය විසින් යොමු කරනු ලබන යම් කාරණයක් සළකා බලා ඒ පිළිබඳ වාර්තා කළ යුතු ය ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහන්, පුහුණු කිරීමේ වැඩ සටහන්, පර්යේෂණ වැඩ සටහන් හෝ විභාග සම්බන්ධ කාරණ නොවන කාරණා සම්බන්ධව මණ්ඩලය වෙත නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ද ඇතුළත් විය හැකි කමිටු පත් කළ යුතු ය ;

(ඈ) මණ්ඩලය වෙත –

( i ) අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සහ විභාග සඳහා නියමයන් නිර්දේශ කළ යුතු ය ;

( ii ) ආචාර්යවරයන් හෝ පරීක්ෂකයන් ලෙස පිළිගැනීමට යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කළ යුතු ය ;

( iii ) නියමිත විභාග සමත්වී ඇති සහ අනෙකුත් නියමිත කොන්දේසි සම්පූර්ණ කර ඇති, උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමිය යුතු තැනැත්තන් නිර්දේශ කළ යුතු ය ;

( iv ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කෙරෙන ආකාරය සහ ඊට අදාළ කොන්දේසි නිර්දේශ කළ යුතු ය ;

( v ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමීමට සුදුසු තැනැත්තන් නිර්දේශ කළ යුතු ය ; තවද

(ඉ) මෙම නියමාවලියේ හෝ වෙනත් උචිත සාධන පත්‍රයක, ආයතනයේ බලතල පිළිබඳව ඇති විධිවිධානවලට ආනුෂාංගික හෝ ඒ විධිවිධානවල ප්‍රතිඵලයක් වන ශාස්ත්‍රීය කාරණාවලට අදාළ අනෙකුත් සියලු බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

14. ලිත් වර්ෂය ආයතනයේ මුදල් වර්ෂය විය යුතු ය.

15. ( i ) ආයතනයෙහි (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් තිබිය යුතු ය. ඒ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය.–

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු සියළු ගාස්තු ;

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ කොමිෂන් සභාව විසින් ප්‍රදාන වශයෙන් ආයතනයට බෙදා දෙන සියළු මුදල් ;

(ඇ) පරිත්‍යාගවලින් අත්වන සියළු ආදායම් ; සහ

(ඈ) කවර වූ හෝ ප්‍රභවයකින් ආයතනයන උපචිත වන වෙනත් සියළු මුදල් .

(2) කිසියම් මාසයක් තුළ දී අරමුදලට ගෙවන ලබන සියළු මුදල් පිළිබඳ සාරාංශයක් අදාළ ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟට එළඹෙන මාසය අවසානවීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

16. (අ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පිළිවෙලකට සහ ආකාරයකට ආයතනයේ ගිණුම් තැබීම ;

(ආ) අරමුදල්වලට ගෙවනු ලබන සියළු මුදල් භාර ගැනීම සහ එම මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(ඇ) බලය දෙනු ලැබූ සියළු ගෙවීම් කිරීම ;

(ඈ) මණ්ඩලය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඇස්තමේන්තු සහ ඉදිරි එළැඹෙන වර්ෂය සඳහා වාර්ෂික මුල්‍ය විසර්ජන පිළියෙල කිරීම,

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය.

එසේ වුවද නිශ්චිත කාර්ය සඳහා කරන ලද ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා කරන ලද පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ආයතනයේ ගිණුම්වල වෙන වෙනම ගිණුම් ගත කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරන ලද්දේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒවා නොවන කාර්ය හෝ අරමුණු සඳහා හෝ ඒ ආදායමෙන් කිසි ගෙවීමක් නොකළ යුතු ය.

17. (1) ආයතනය විසින් එහි කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් සහ සංඛ්‍යාලේඛන, කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චිතව නියම කරනු ලැබිය හැකි පිළිවෙලකට සහ ආකාරයකට හා එසේ නියම කරනු ලැබිය හැකි විස්තර ද ඇතුළත්ව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තැබිය යුතු ය.

18. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළව පනතේ XIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණනය කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

19. (1) ආයතනයේ කාර්ය මණ්ඩලය, ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම සහ ඉටු කිරීම සඳහා, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පත් කරන ලද නිලධරයන්ගෙන්, ආචාර්යවරුන්ගෙන් සහ සේවා නියුක්තිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය, විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතරින්, විශ්ව විද්‍යාලය විසින් මුදා හැරීමෙන් හෝ අවස්ථාවෝචිත පරිදි විශ්ව විද්‍යාලය විසින් හෝ කොමිෂන් සභාව විසින් පත් කිරීමෙන් සපයනු ලැබිය යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් සම්බන්ධව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) විශ්ව විද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු ආයතනයේ සේවය සඳහා පූර්ණකාලීන පදනම මත මුදා හැර ඇති අවස්ථාවක විශ්ව විද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි ඔහු ලැබූ වැටුප සහ දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. එසේ නොවන අවස්ථාවකදී විශ්ව විද්‍යාලය විමසා ආයතනය විසින් නිශ්චය කරන, කොමිෂන් සභාව අනුමත කරන පරිදි වූ දීමනාවක් එම නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවා නියුක්තිකයාට ආයතනය විසින් ගෙවනු ලැබිය හැකි ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, අධ්‍යක්ෂවරයාගේ විධානයට හා විනය පාලනයට යටත් විය යුතු ය.

20. ආයතනයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ ඒ සාමාජිකයන් පත්කිරීමේ ලා යම් දෝෂයක් හෝ දෝෂ තිබීමේ හේතුවෙන්ම පමණක් ආයතනයේ යම් ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ නීති කෘත්‍යයක් නිර්බල නොවිය යුතු ය.

21. මේ නියමාවලියෙහි–

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත අදහස් වේ.

"උචිත සාධන පත්‍රය" යන්නෙන් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

" ආචාර්යවරයා " යන්නෙන් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව " යන්නෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

12 – 629

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී